# ශ්‍රී ලංකාවේ කිරි ගව කර්මාන්තය


**ඩබ්.එච්.ජේ. ශාන්ත**

*පර්යේෂණ නිලධාරී*

**කෘෂි හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශය**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**


**චාරිත්‍ර ශිෂ්ටාචාරයේ ප්‍රධානම ව්‍යුත්පන්නය වන කෘෂිකර්මාන්තය සඳහා ශ්‍රී ලාංකීය මානව විකාශනය තුළ හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. එය තවදුරටත් ශ්‍රී ලාංකිකයාගේ ආත්මය තුළ අක්මුල් විහිදුවා පැතිරී තිබේ. කෘෂිකර්මාන්තය විචාරීමේ දී, එය ශ්‍රී ලංකාවට අදාලව 'බව භෝග' සම්පත ලෙස අර්ථ දැක්විය හැකිය. එනම්, කෘෂිකර්මාන්තය ප්‍රධාන අංග දෙකකින් සමන්විතව පැවති බවත්, ඒවා වී වගාව ප්‍රධාන කොටගත් බෝග වගාව සහ ගව සම්පත කේන්ද්‍ර කොට ගත් සත්ත්ව පාලනය වූ බවත් පැහැදිලි කරුණකි.** වී වගාව හා ආශ්‍රිත කටයුතු ශ්‍රී ලාංකිකයාගේ සංස්කෘති -යෙහි මූලික අංග බවට පත්වූයේ යම් සේද, එම ලෙසටම **ගව සම්පත** සහ එහි ප්‍රධානතම නිමැවුම වන කිරි සඳහා ද, එවැනිම ප්‍රමුඛස්ථානයක් හිමි විය. එහි ප්‍රතිඵලයක් ලෙස කිරිගව පාලනය ඈත අතීතයේ සිටම විශිෂ්ඨ ස්ථානයක් හිමි කරගත් බව පැහැදිලි කරුණකි. එමෙන්ම, ගව පාලනය කෘෂිකර්මාන්තය හා ආශ්‍රිත කටයුතු වල දී අවශ්‍ය සත්ත්ව ශ්‍රමය ලබා ගැනීමට සහ බෝග වගාව සඳහා අවශ්‍ය වූ ප්‍රධානතම කාබනික පොහොර ලබා ගැනීමේ මූලය ලෙස ද උපයෝගී විය. වර්තමානයේ දී, බොහෝ දුරට **කාර්මීකරණය** වූ සහ අකාබනික පොහොර මත පදනම් වූ කෘෂි බෝග වගා රටාව තුළ, සත්ත්ව ශ්‍රමය සහ ගොම පොහොර යොදා ගැනීම සාපේක්ෂව අවම තත්ත්වයකට පත්ව ඇති බැවින්, වර්තමානය වන විට, ගව පාලනය කිරි නිෂ්පාදනය අරමුණු කොටගත් කර්මාන්තයක් ලෙස මූලික වෙනස්වීම් රසකට බඳුන් වී තිබේ. එහෙයින්, ශ්‍රී ලංකාවේ වර්තමාන කිරි ගව පාලනය හා ආශ්‍රිත කරුණු සාකච්ඡා කිරීම මෙම ලිපියේ මූලික අරමුණ ලෙස සඳහන් කළ හැකිය.

ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය මූලික වශයෙන් සමන්විත වන්නේ 300,000කට ආසන්න සුළු පරිමාණ කිරි ගොවීන් සමූහයක ගෙනි. දේශීය කිරි නිෂ්පාදනයේ 95% කට වැඩි ප්‍රතිශතයක් සඳහා මෙම සුළු පරිමාණ කිරි ගොවීන් සමූහය වෙතින් සැලසෙන දායකත්වය කර්මාන්තය තුළ ඉතා වැදගත් ස්ථානයක් අත් කර ගනී. කෘෂිකර්මාන්තය තුළ පශු සම්පත් අංශය මඟින් සපයනු ලබන්නේ 8.5% ක් තරම් වූ සාපේක්ෂව අඩු දායකත්වයකි. **පසුගිය වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය වෙත කෘෂි කර්මාන්තයේ ආංශික දායකත්වය 19% කි.** දේශීය පාරිභෝගික ඉල්ලුම සපුරාලීම සඳහා රට තුළ කිරි නිෂ්පාදනයේ වර්තමාන දායකත්වය 15% ක් තරම් ඉතාමත් පැහැදිලි අවම මට්ටමක පවතී. මෙම අවම නිෂ්පාදන හැකියාව හේතුකොට ගෙන වසරින් වසර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය ඉහළ යාම ඉතාමත් අහිතකර ප්‍රතිඵල දේශීය කිරි නිෂ්පාදකයාට මෙන්ම අවසාන පාරිභෝගිකයා වෙත ද අත්වීමට හේතු පාදක වී තිබේ. දේශීය වශයෙන් නිපදවෙන කිරි ප්‍රමාණය නිරපේක්ෂ ලෙස ඉහළ යාමක් සිදු වුව ද, වැඩිවන ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නිෂ්පාදන-යක් ඒ හරහා සිදු නොවීම හේතුවෙන් කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය ඉහළ යාම සිදු වී තිබේ. (2002 වර්ෂයට සාපේක්ෂව, 2003 වර්ෂය තුළ දී දේශීය කිරි නිෂ්පාදනයේ 2% ක වැඩි වීමක් කිරි කර්මාන්තය තුළ නිරීක්ෂණය කළ හැකි වේ.). එමෙන්ම, 1988 දී සමස්ථ වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 225 ක් වශයෙන් පැවති, 1998 දී එය ලීටර් මිලියන 341 දක්වා 51% ක පමණ වසර 10 ක කාල පරාසයක් තුළ වර්ධනයක් පෙන්නුම් කිරීමෙන් කිරි නිෂ්පාදනයේ නිරපේක්ෂව සිදු වූ වර්ධනය වටහා ගත හැකිය. 2002 වර්ෂය තුළ දී, දේශීය වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 349 ක් පමණ වූ අතර එය ආසන්න වශයෙන් එළකිරි ලීටර් මිලියන 266 ක් හා මී කිරි ලීටර් මිලියන 83 කින් සමන්විත විය. එම නිෂ්පාදනය ප්‍රමාණවත් වූයේ දේශීය අවශ්‍යතාවයෙන් 20% කටත් වඩා අඩු ප්‍රතිශත ප්‍රමාණයක් සඳහා පමණකි. එබැවින්, එම වසර තුළ ආනයනය කරන ලද සමස්ථ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයන් හි මූල්‍යමය වටිනාකම රුපියල් මිලියන 10488 ක් වැනි අතිවිශාල අගයක් විය. එම වසර තුළ ආනයනික මුළු කිරි නිෂ්පාදනයන් හි ප්‍රමාණාත්මක අගය මෙට්‍රික් ටොන් 65821 ක් වූ අතර එම අගය 2001 වසරට සාපේක්ෂව (මෙට්‍රික් ටොන් 55471) 18% ක ඉහළ යාමකි. මෙම අගයන් මඟින් වෙළඳපොළ අවශ්‍යතාවය සඳහා ප්‍රමාණවත් කිරි නිෂ්පාදනයක් දේශීයව සිදුනොවීම හේතුවෙන් විදේශ විනිමය රට වෙතින් ඉවතට ගලා යාමේ ස්වරූපය මැනවින් පිළිබිඹු වේ.

1977 පසු සිදු වූ ආර්ථික ලිහිල් කරන ප්‍රතිපත්ති හේතුවෙන් රට තුළට ගලා ආ පාරිභෝගික භාණ්ඩ හා සේවා අතර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන සඳහා ද වැදගත් තැනක් හිමි වේ. **ආහාර වර්ග සඳහා වැයවන දෙවන වැඩිම විදේශ විනිමය ප්‍රමාණය සඳහා වග කියනු ලබන්නේ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයන් ය.** වෙළඳපොළ තුළ

කිරි පිටි නිෂ්පාදන සුලභ වීම නිසා මී කිරි පාරිභෝජනය නාගරික ප්‍රජාව අතර මෙන්ම ඈත ගම් ප්‍රදේශයන් හි දිළිඳු පවුල් අතර ද දැඩි ලෙස ප්‍රචලිත වී තිබේ.

ගුණාත්මක බවින් අඩු කිරි පිටි හා ආශ්‍රිත නිෂ්පාදන සඳහා පහසුවෙන් ප්‍රවිෂ්ට විය හැකි වෙළඳ පොළක් බවට ශ්‍රී ලංකාව පත්ව තිබේ.

එබැවින්, ආනයනික කිරි ආශ්‍රිත නිෂ්පාදන අතර කිරි පිටි සඳහා හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. 2002 වසරේ ආනයනික මුළු කිරි පිටි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 56,000 කි. එය ආනයනික මුළු කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙන් (මෙ.ටො. 65821) 85% කට වඩා වැඩි ප්‍රතිශතයකි. කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සඳහා වැය වූ විදේශ විනිමය ප්‍රමාණය රු. මිලියන 10,488 කි. මෙලෙස රට තුළට විශාල වශයෙන් කිරිපිටි ආනයනය කිරීම කෙරෙහි ශ්‍රී ලංකාවේ කිරි පිටි ආනයනික බද්ද සාපේක්ෂව පහළ අගයක් ගැනීම සෘජුව බලපා ඇති බව සැලකේ.

මෙම තත්ත්වය නිසා ගුණාත්මක බවින් අඩු කිරි පිටි හා අශ්‍රිත නිෂ්පාදන සඳහා පහසුවෙන් ප්‍රවිෂ්ඨ විය හැකි වෙළඳ පොළක් බවට ශ්‍රී ලංකාව පත්ව තිබේ. එමෙන්ම, මෙම තත්ත්වය අවස්ථාව කොට ගනිමින් දේශීය කිරි නිෂ්පාදන හෝ **කිරි එකතු කිරීමේ ක්‍රියාවලිය** තුළ හෝ කිසිදු ආයෝජනයක් සිදුනොකොට කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීමේ නියුතු ආයෝජන මණ්ඩල වරප්‍රසාද ලත් කිරි පිටි සමාගම් රාශියක් බිහි වී ඇත. මෙලෙස පාලනයකින් තොරව ප්‍රමිතියකින් තොර කිරිපිටි හා ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම අහිතකර සෞඛ්‍ය ගැටළු ඇති කිරීමට සෘජුවම බලපෑ හැකිය. එමෙන්ම, මෙම තත්ත්වය දේශීය කිරි නිෂ්පාදකයාට ද දැඩිව බලපෑම නොවැළැක්විය හැකි වේ. එබැවින්, **දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම හරහා ද්‍රව කිරි පාරිභෝජනය වෙත ප්‍රජාව යොමු කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමුව පවතී.**

කෙසේ වෙතත්, කලාපයේ රට වලට සාපේක්ෂව, ශ්‍රී ලංකාව තුළ ඒක පුද්ගල වාර්ෂික කිරි සුලභතාවය ද ඉතාමත් පහළ අගයක් ගනී. **වෛද්‍ය පර්යේෂණ ආයතනය** මගින් නිර්දේශිත ඒක පුද්ගල වාර්ෂික කිරි අවශ්‍යතාවය කි.ග්‍රෑ. 60-66 ක් වුව ද, එය කි.ග්‍රෑ. 35 වැනි පහළ අගයක පවතී. ඉන්දියාවේ හා පාකිස්ථානයේ ඒක පුද්ගල වාර්ෂික කිරි පාරිභෝජනය පිළිවෙලින් කි.ග්‍රෑ. 123 හා කි.ග්‍රෑ. 69 වේ. (ශ්‍රී ලංකාවේ නිර්දේශිත දෛනික ඒක පුද්ගල කිරි පාරිභෝජනය මි.ලී.180 වුව ද එය මි.ලී. 95 වැනි පහළ අගයක් ගනී.) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රටාව මෙන්ම කිරි ගව කර්මාන්තය ද, ඒ ඒ ප්‍රදේශයේ පවතින භූගෝලීය, දේශගුණික හා කෘෂිකාර්මික සාධක මත විශාල ලෙස වෙනස්වීම් වලට ලක්ව තිබේ. කෙසේ වෙතත්, ප්‍රධාන කිරි **නිෂ්පාදන පද්ධතීන් Systems** 6ක් මූලිකව නිරීක්ෂණය කළ හැකිය.

i වතු ආශ්‍රිත පද්ධතිය

ii පොල් ත්‍රිකෝණ පද්ධතිය

iii මැද රට සුළු පරිමාණ පද්ධතිය

iv වියළි කලාපීය පද්ධතිය

v යාපන නාගරික පද්ධතිය

vi මී ගව පද්ධතිය

## වතු ආශ්‍රිත පද්ධතිය

කඳුරට සහ මැදරට ප්‍රදේශ ආශ්‍රිතව පවතී. තේ හා රබර් වතු කම්කරුවන් විසින් සිදුකරනු ලබන ගව පාලනය මෙයට ඇතුළත් ය. අඩු සතුන් සංඛ්‍යාවක් (බොහෝ විට 2 හෝ 3 ක්) වඩාත් සූක්ෂම ආකාරයට පාලනය කිරීම සිදුකරනු ලබයි. සතුන් දිගේලි කිරීම සඳහා පවතින ඉඩම් සීමිත බැවින්, සතුන් ගව ගාල් තුළම රඳවා ගෙන පෝෂණය කිරීම සුලභ දර්ශනයකි. සාන්ද්‍ර ආහාර සාපේක්ෂව වැඩි ප්‍රමාණයකින් සැපයීම දක්නට ලැබේ.

## පොල් ත්‍රිකෝණ පද්ධතිය

පහතරට තෙත් කලාපය සහ අතරමැදි කලාප තුළ පිහිටි තෙත් ප්‍රදේශ ඇතුළත් පොල් ත්‍රිකෝණයට අයත් ප්‍රදේශ මෙම පද්ධතිය තුළ අන්තර්ගත වී තිබේ. ප්‍රධාන වශයෙන්ම **කොළඹ, ගම්පහ** සහ **කුරුණෑගල** දිස්ත්‍රික්කයන් හි පොල් වගාවට යටත් ප්‍රදේශ තුළ සිදු කෙරෙන ගව පාලනය මේ යටතට ගැනේ. පොල්වතු ආශ්‍රිතව ස්වාභාවිකව වැඩෙන තෘණ ආහාර ප්‍රධාන කොට ගනිමින් සතුන් දිගේලි කිරීම මගින් හෝ පොල් ඉඩම් තුළ උලාකෑම සඳහා නිදහස් කිරීම මගින් පාලන කටයුතු සිදු කරයි.

## මැදරට සුළු පරිමාණ පද්ධතිය

කඳුරට හා මැදරට වතු ආශ්‍රිත නොවන සාම්ප්‍රදායික ගම්මාන තුළ ඉඩම් හිමි ගොවීන් විසින් සිදුකරනු ලබන ගව පාලනය යි. බෝග වගාවට අමතරව ද්විතීයික ආදායම් මාර්ගයක් ලෙස කිරිගව පාලනය සිදුකරනු ලබන අතර කිරි ලබා ගන්නා සතුන් සංඛ්‍යාව 3-4 වැනි ගණනකට සීමා වේ.

## වියළි කලාපීය පද්ධතිය

හෙක්ටයාර් මිලියන 4-12 පුරා පැතිරුණු වියළි කලාපීය භූමි ප්‍රදේශය තුළ විශාල ගව පට්ටි වශයෙන් සිදුකෙරෙන ගව පාලනය මේ යටතට ගැනේ. දේශීය බටු

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම හරහා ද්‍රව කිරි පාරිභෝජනය වෙත ප්‍රජාව යොමු කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමුව පවතී.

ගවයින් විශාල වශයෙන් පාලනය කිරීමත් නිදහසේ තෘණ උලාකෑම සඳහා යොමු කිරීමත් ප්‍රධාන අංගයන් වේ.

## යාපන නගර පද්ධතිය

යාපන අර්ධද්වීපයේ නගර සීමාව තුළ ඉතා සූක්ෂම පාලන ක්‍රම යටතේ අතීතයේ සිටම පැවත ආ ජනප්‍රිය ගව පාලන පද්ධතියකි. වසර 25 කට ආසන්න කාලයක් තිස්සේ පැවති සිවිල් යුද්ධය මඟින් පද්ධතිය කෙරෙහි යම් බලපෑමක් සිදු වී තිබේ. ප්‍රධාන වශයෙන්ම සාන්ද්‍ර ආහාර සැපයීම හා තෘණ කපා ගෙනැවිත් දීම මඟින් පෝෂණ කටයුතු සිදු කරයි.

| වර්ෂය | එළගව ගහනය |
|---|---|
| 1993 | 1704000 |
| 2000 | 1684488 |
| 2002 | 1510000 |

## මී ගව පද්ධතිය

එළ ගව සංඛ්‍යාවට සාපේක්ෂව වැඩි සංඛ්‍යාවකින් යුක්තව ගව පට්ටි ලෙස පාලනය වේ. නිදැල්ලේ උලා කෑම සඳහා යොමු කිරීමෙන් පෝෂණ අවශ්‍යතාව ප්‍රධාන වශයෙන් සැපයේ.

ඉහත දී සඳහන් කළ පරිදි පසුගිය වසර කිහිපය තුළ දී ,කිරි නිෂ්පාදනයෙ හි යම් වර්ධනයක් සිදු වුව ද, 1993 සිට 2002 දක්වා වසර 10 ක කාල පරාසයක් තුළ දී එළ ගව ගහනය 11% කට වඩා වැඩි ප්‍රතිශතයකින් පහළ යාමක් නිරීක්ෂණය කළ හැකිය.

2002 වසර අවසාන වන විට, සමස්ථ දේශීය ගුව ගහනය මිලියන 2.15 කට ආසන්න අගයක් ගෙන තිබුණි. එය එළ ගවයින් මිලියන 1.15 හා මී ගවයින් මිලියන 0.64 කින් සමන්විත විය. සමස්ථ දේශීය ගව ගහනයෙන් 70% කට ආසන්න ප්‍රමාණයක් වියළි කලාපය තුළ ව්‍යාප්තව සිටී.

ගව ගහනය වැඩිම දිස්ත්‍රික්ක ලෙස පිළිවෙලින් **කුරුණෑගල** (18800) **අනුරාධපුර** (150000) **මඩකලපුව** (133000) **අම්පාර** (90000) සහ **බදුල්ල** (75000) හඳුනාගත හැකිය. වැඩිම මී ගව ගහනයක් සහිත දිස්ත්‍රික්කය ලෙස **කුරුණෑගල** දිස්ත්‍රික්කය සදහන් කල හැකි අතර එහි මුළු මී ගවයින් සංඛ්‍යාව (118700) පමණ වේ. **කුරුණෑගල** දිස්ත්‍රික්කයට පසුව වැඩිම මී ගව ගහනයක් සිටින දිස්ත්‍රික්ක ලෙස පිළිවෙලින් **අනුරාධපුරය, මඩකලපුව, හම්බන්තොට** සහ **පොලොන්නරුව** දිස්ත්‍රික්ක සදහන් කළ හැකිය.

කෙසේ වුව ද, ඒ ඒ කලාවකවානු තුළ දී, බලයට පත් වූ ආණ්ඩු විසින් දේශීය කිරිගව කර්මාන්තය සංවර්ධනය කිරීම අරමුණු කොටගත් විවිධ වැඩ සටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදී. ඒවා නියමිත අරමුණු වෙත ළඟාවීම පිළිබඳව විවිධ ගැටළු පවතී. කිරිගව කර්මාන්තය සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තිය පහත සදහන් කරුණු ඉලක්ක කොට තිබේ.

- කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයන් අතින් ස්වයංපෝෂිත වීම
- පෝෂණය හා සෞඛ්‍යය වැඩිදියුණු කිරීම
- ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම
- ග්‍රාමීය ප්‍රදේශයන් හි දිළිඳු බව පිටුදැකීම
- ජාතික ආර්ථක වර්ධනයක් ඇති කිරීම

මෙම ඉලක්ක වෙත ළඟාවීම පහත සඳහන් කරුණු හරහා සිදුකිරීම කෙරෙහි ප්‍රතිපත්ති සම්පාදකයන් තම අවධානය යොමුකොට සිටී.

## දේශීය කිරි නිෂ්පාදනය වැඩිකිරීම

- කිරි කර්මාන්තයේ ඵලදායිතාවය ඉහළ නැංවීම
- අභිජනන කටයුතු පුළුල් කිරීම
- ලාභ ආන්තිකයන් වැඩි කිරීම
- නිෂ්පාදන වියදම අඩු කිරීම.
- කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය අඩු කිරීම
- කිරි හා ආශ්‍රිත නිෂ්පාදනයන් ගේ පාරිභෝගික මිල අඩු කිරීම
- කිරි ගව කර්මාන්තයෙන් ගොවීන් ඉවත්වීම වැලැක්වීම

දේශීය වශයෙන් නිපදවෙන කිරි ප්‍රමාණයේ දායකත්වය 15% ක තරම් ඉතා අඩු මට්ටමක සිට ස්වයංපෝෂිත මට්ටම කරා ළඟා වීම සඳහා දීර්ඝ කාලීන වැඩපිළිවෙළක් අවශ්‍යය. ඉහත දී සඳහන් කළ පරිදි දේශීය ගව ගහනයෙන් 70% පමණ වියළි කලාපය තුළ ව්‍යාප්තව පැවතිය ද, එම ප්‍රදේශ වලින් සමස්ථ කිරි නිෂ්පාදනයට දක්වන දායකත්වය 39% වැනි සාපේක්ෂව අඩු ප්‍රමාණයක් වේ. විශේෂයෙන්ම, මෙම ප්‍රදේශ තුළ ඉතාමත් අඩු කිරි අස්වැන්නක් ලබාදෙන (දිනකට ලීටර් 1ක් වැනි ප්‍රමාණයක් ) සහ ක්ෂීර කාලය **(Lactation Period)** අඩු (මාස 6 ක් පමණ වන) දේශීය බටු ගව ගහනය ප්‍රමුඛවීම මෙම තත්ත්වයට බෙහෙවින්ම බලපා තිබේ. වැඩි කිරි ප්‍රමාණයක් ලබාදෙන ක්ෂීර කාලය දිගු යුරෝපීය ගව වර්ග සහ දෙමුහුම්

**ගව ගහනය වැඩිම දිස්ත්‍රික්ක ලෙස පිළිවෙලින් කුරුණෑගල අනුරාධපුර මඩකලපුව අම්පාර සහ බදුල්ල හඳුනාගත හැකිය. වැඩිම මී ගව ගහනයක් සහිත දිස්ත්‍රික්කය ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කය සදහන් කල හැකි අතර එහි මුළු මී ගවයින් සංඛ්‍යාව 118700 පමණ වේ.**

ගව වර්ග සඳහා හිතකර පාරිසරික තත්ත්ව පවතින **නුවරඑළිය, බදුල්ල** සහ මහනුවර දිස්ත්‍රික්ක වෙතින් වැඩිම කිරි නිෂ්පාදනයක් ලැබේ.

දේශීය මුළු කිරි දෙනුන් ගහනය සමග සැසඳීමේ දී, සාපේක්ෂ දෛනික කිරි නිෂ්පාදනය (එක දෙනක් සඳහා) ආසන්න වශයෙන් ලීටර් 2 ක් ලෙස ඇස්තමේන්තු කොට තිබේ. කිරි

**මධ්‍යන්‍ය මාසික කිරි නිෂ්පාදනය (2002)**

| | එළකිරි ලීටර් | මී කිරි ලීටර් |
|---|---|---|
| නුවරඑළිය | 3,848,800 | 8,800 |
| බදුල්ල | 2,043,500 | 26,000 |
| මහනුවර | 1,723,400 | 18100 |
| කුරුණෑගල | 1,707,000 | 375,300 |
| මඩකලපුව | 1,580,800 | 1,337,200 |

නිෂ්පාදනය වැඩි කිරීම පිළිබඳ සැලකීමේ දී, ඵලදායිතාවය ඉහළ නැංවීම පිළිබඳව විශේෂයෙන්ම අවධානය යොමු කළ යුතුය. ඉහතින් සඳහන් කළ පරිදි **ඒ ඒ කෘෂි දේශගුණික කලාපයන් හි පවතින පාරිසරික තත්ත්වයන්ට ගැලපෙන ආකාරයේ සතුන් හඳුන්වාදීම හා දැනට සිටින සතුන් අභිජනන වැඩපිළිවෙල හරහා වැඩිදියුණු කිරීම සිදුකළ යුතු වේ.** වැඩි කිරි ප්‍රමාණයක් ලබාදීමේ **ප්‍රවේණි විභවතාවය (Genetic Potential)** හා නියමිත කාල සීමාවන් තුල දී පැටවුන් බිහිකිරීම සඳහා **ප්‍රජනන හැකියාව (Reproduction Capacity)** සහිත සතුන් පාලනය කෙරෙහි ගොවීන් යොමු කළ යුතුය. මේ සඳහා ඒ ඒ ප්‍රදේශ සඳහා සුදුසු අභිජනන වැඩ පිළිවෙලවල් හඳුන්වාදීම අවශ්‍යය. මෙතෙක් පැවති අභිජනන වැඩ පිළිවෙල හරහා උසස් ආරයේ යුරෝපීය සතුන් මෙරටට හඳුන්වා දීම හා කෘත්‍රිම සිංචන කටයුතු හරහා වැඩි කිරි ප්‍රමාණයක් ලබා දෙන සතුන් ගොවීන් වෙත ලබා දී තිබේ. විශේෂයෙන්ම, උඩරට ප්‍රදේශය තුල යුරෝපීය ආරයේ සතුන් පාලනය සඳහා සුදුසු පාරිසරික තත්ත්ව පවතී. එමෙන්ම, මැදරට හා පහතරට තෙත් කලාපය තුල සහ අතරමැදි කලාපයේ තෙත ප්‍රදේශ වල ද යුරෝපීය ආරයේ දෙමුහුම් සතුන් දැකිය හැකිය.

තව ද, **ෆ්‍රීෂියන්(Friesian)** හා **ජර්සි (Jersey)** යන යුරෝපීය ගව විශේෂ මෙරට අභිජනන වැඩසටහන් වල දී බහුලව යොදාගන්නා නව වර්ග දෙකකි. **ෆ්‍රීෂියන්** සතුන් වැඩි නිෂ්පාදන විභවතාවයක් සහිත වීම විශේෂ ලක්ෂණයකි. විශේෂයෙන්ම, උඩරට,මැදරට හා පහතරට තෙත් කලාපයේ සිදු කරනු ලබන දෙමුහුම් වැඩ සටහන් සඳහා වඩාත් උචිත වේ. **ෆ්‍රීෂියන්** වර්ගයට සාපේක්ෂව වඩා වැඩි පාරිසරික තත්ත්ව පරාසයකට ඔරොත්තු දීමේ හැකියාව සහිත **ජර්සි** ආරයේ සතුන් පහත රට වියලි කලාපය තුල දී සහ අතර මැදි කලාපය තුල දී විවිධ වැඩසටහන් සඳහා යොදා ගනී.

මෙලෙස උසස් ආරයේ සතුන් අභිජනන වැඩපිළිවෙල හරහා බෝ කිරීම මගින් හෝ ගැහැණු සතුන් රජයේ ගොවිපළ වෙතින් ගොවීන් වෙත ලබාදීම මගින් හෝ උසස් ආරයේ ගව ගහනය වැඩි කර ගත හැකිය.

වියලි කලාපයේ පවතින රළු පාරිසරික තත්ත්වය යටතේ දෙමුහුම් කටයුතු සඳහා යොදා ගන්නා ප්‍රධානතම ඉන්දීය ආරයේ ගව වර්ග වූයේ **සාහිවාල්** සහ **රතු සින්ධි** යන ගව වර්ගයන් ය. රළු පාරිසරික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ සහ රෝගයන්ට ප්‍රතිරෝධී දේශීය සතුන් සමග දෙමුහුම් කිරීම සඳහා මෙම **සාහිවාල්** සහ **රතු සින්ධි** යන ඉන්දීය ආරයේ ගව වර්ග යොදාගත හැකිය.

එළ ගවයන් මෙන්ම මී ගවයන් ද සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. **සමස්ථ කිරි නිෂ්පාදනය කෙරෙහි මී කිරි මගින් ලැබෙන දායකත්වය 25% පමණ (ඉන්දියාවේ දී මෙය 50% කට වඩා වැඩි අගයක් ගනී.)** වේ. එබැවින්, මී ගවයන් සඳහා පවතින දෙමුහුම් අභිජනන වැඩපිළිවෙළ වඩාත් ශක්තිමත් කළ යුතුය. මේ වන විටත්, **ඉන්දීය (මූරා)** සහ **පාකිස්ථාන (නීලිරවි)** උසස් ආරයේ මී ගව ප්‍රභේද යොදා ගෙන කරුනු ලබන දෙමුහුම් වැඩසටහන් ක්‍රියාත්මක වේ.

කෙසේ වෙතත්, රජය යටතේ පැවති අභිජනන ගොවිපළ ක්‍රියාකාරිත්වය අකාර්යක්ෂම වීම සහ අනෙකුත් රජයේ ගොවිපළ වෙතින් හෝ උසස් ආරයේ ගැහැණු සතුන් ලබාගැනීමට නොහැකි වීම ගොවීන් මුහුණපානු ලබන ප්‍රධාන ගැටළුවකි. මෙම තත්ත්වය යටතේ දී කෘත්‍රිම සිංචනය වැඩසටහන සඳහා හිමිවන්නේ විශේෂ ස්ථානයකි. සමස්ථ දේශීය ගව ගහනය මිලියන 2.1 පමණ වුව ද, වසර 2000 වන විට අභිජනනය කළ හැකි මුළු ගව ගහනය (Breedable Cattle Population ) මිලියන 1.0 කට ආසන්න (එළ ගවයින් මිලියන 0.76 හා මී ගවයන් මිලියන 0.24 ක) අගයකි.

කෘත්‍රිම සිංචනය හරහා ගවයින් ආරය උසස් කිරීමේ කටයුතු ආරම්භ වූයේ 1950 තරම් ඈත කාලයකදී ය. මේ වන විට, ආවරණය කිරීමට හැකිව ඇති ගව ගහනය අභිජනනය කළ හැකි ගව ගහනයේ 20% කටත් වඩා අඩු ප්‍රතිශතයකි. එමෙන්ම, කෘත්‍රිම සිංචනය සාර්ථක වීමේ හෝ පිළිසිද ගැනීමේ ප්‍රතිශතය 25-30% තරම් අඩු අගයක් ගනී. එබැවින්, පවතින කෘත්‍රිම සිංචන වැඩසටහන් වඩාත් කාර්යක්ෂම කළ යුතු වේ. කෘත්‍රිම සිංචන කටයුතු ප්‍රධාන වශයෙන්ම සිදු කරනු ලබන්නේ පශු වෛද්‍ය කාර්යාල වෙතින් වන අතර සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් සහ පුද්ගලික කෘත්‍රිම සංචන තාක්ෂණවේදීන් මෙම කාර්යය

> **සමස්ථ කිරි නිෂ්පාදනය කෙරෙහි මී කිරි මගින් ලැබෙන දායකත්වය 25% පමණ (ඉන්දියාවේ දී මෙය 50% කට වඩා වැඩි අගයක් ගනී.) වේ.**

සඳහා අනුයුක්තව සිටී. **උසස් ආරයේ පට්ටි වස්සන් යොදාගෙන අභිජනන කටයුතු ව්‍යාප්ත කළ හැකි වුව ද, රජයේ ගොවිපළ මගින් එවැනි සේවාවන් සැපයීමක් සිදු නොවේ.** එමෙන්ම, පට්ටි වස්සෙකු නඩත්තු කිරීම පිරිවැය අධික කටයුත්තක් බැවින් ගොවීන් එවැනි කටයුත්තක් සඳහා යොමුවීම අවම මට්ටමක පවතී.

**උසස් ආරයේ පට්ටි වස්සන් යොදාගෙන අභිජනන කටයුතු ව්‍යාප්ත කළ හැකි වුව ද රජයේ ගොවිපළ මගින් එවැනි සේවාවන් සැපයීමක් සිදු නොවේ.**

**තව ද, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** හරහා ක්‍රියාත්මක වූ **වැස්සි පැටවුන් පාලන වැඩසටහන Female Calves Salvage Program** හෙවත් **කේරල ව්‍යාපෘතිය** වැනි වැඩ සටහන් හඳුන්වා දීම වැදගත් වේ.

කිරි නිෂ්පාදනයේ ඵලදායි -තාවය වැඩිකිරීම සඳහා ගත හැකි තවත් වැදගත් පියවරක් වන්නේ නැම්බියන් සඳහා **ප්‍රථම පැටවා ලැබීමේ වයස (Age of 1st Calving)** හා කිරි දෙනුන් සඳහා **පැටවුන් ලැබීමේ කාල පරතරය (Calving Interval)** අඩු කිරීම ය. මෙම ක්‍රියාව හරහා පැටියකු ලැබ් මාස 3 ක් වැනි කාලයක දී නැවතත් පට්ටියට දැමීම හරහා ගැබ් ගැන්වීමත්, මාස 9 ක පමණ ක්ෂීර කාලයකට හා මාස 3-4 ක පමණ **වියළි කාලයකට Dry Period** පසු නැවත පැටියකු ලබා ගැනීමත් සිදු කරගත හැකිය. මෙලෙස නිසි චක්‍රයක් පවත්වා ගැනීම සඳහා ගැහැණු සතා මදයට පැමිණීම නිසිලෙස හඳුනා ගැනීමත්, නියමිත අවස්ථාවේ කෘත්‍රිම සිංචන කටයුතු හෝ පට්ටි දැමීම සිදුකිරීමත් කළ යුතු වේ. මද ලක්ෂණ හඳුනා ගැනීම පිළිබඳ උපදෙස් ගොවියා වෙත ලබාදීම හා නියමිත අවස්ථාවේ දී අභිජනන සේවාවන් සැපයීම සඳහා අදාල අංශයන් හි මානව හා භෞතික සම්පත් සංවර්ධනය සිදුකළ යුතු වේ.

නියමිත අවස්ථාවේදී, දෙනුන්, නැම්බියන් මදයට පැමිණීම හා නිරෝගී පැටවුන් ලබාදීම **Reproductive Capacity** නියමිත ප්‍රවේණික විභවතාවය අනුව කිරි අස්වැන්නක් ප්‍රමාණවත් ක්ෂීර කාලයක් තුළ ලබාදීම, සතාගේ පෝෂණය මත සෘජුවම රඳා පවතී. ගව පාලනයේ පිරිවැයෙන් 60%-70% අතර ප්‍රමාණයක් සත්ත්ව ආහාර හා පෝෂණය සඳහා දැරීමට සිදු වේ. මෙයට ප්‍රධානම හේතුව සාන්ද්‍ර ආහාර සඳහා අධික වියදමක් දැරීමට සිදු වීමයි. ප්‍රධාන වශයෙන්ම, පොල් පුන්නක්කු, **සහල් නිවුඩු හා සහල් කුඩු Rice Bran And Rice Polish** සකසන ලද **ගව ආහාර මිශ්‍රනය Cattle Feed Mixture** මෙන්ම සාන්ද්‍ර ආහාර ලෙස භාවිතයට ගනී. කුකුළු සහ ඌරු පාලනයේ පවතින වර්ධනය නිසා සත්ත්ව ආහාර නිෂ්පාදන සංරචක සඳහා පවතින අධික ඉල්ලුම ඉහළයාම මෙලෙස සාන්ද්‍ර ආහාර මිල ඉහළ යාම කෙරෙහි බලපා තිබේ. සාන්ද්‍ර ආහාර මිල ඉහළයාම සූක්ෂම ක්‍රමය යටතේ සත්ත්ව පාලනය සිදු කරන ගොවීන් වෙත දැඩිව බලපා තිබේ. තෘණ හා වෙනත් කොළ ආහාර, කිරි ගව පෝෂණ යේ ඉතා වැදගත් තැනක් ගන්නා අතර ඒවා ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම මගින් ආර්ථිකව ලාභදායි ලෙස කිරිගව පාලනය සිදුකල හැකි වේ.

සුලභතාවයේ හා ගුණාත්මක භාවයෙහි නිරන්තරයෙන් සිදු වන වෙනස්වීම හා සාන්ද්‍ර ආහාර සඳහා වැයවන අධික පිරිවැය හේතුවෙන් වසර පුරාම සත්ත්ව පෝෂණය සඳහා අවශ්‍ය වන ආහාර සැපයීමට නොහැකි වීම කිරි නිෂ්පාදනය ඒකාකාරිව පවත්වා ගෙන යාමට පවතින ප්‍රධාන බාධකයන් ගෙන් එකකි. කෙසේ වෙතත්, අපනයනය සඳහා අතිරික්ත ලෙස කිරි නිපදවන බොහෝ සංවර්ධිත රටවල සතුන්ගේ පෝෂණය ප්‍රධාන වශයෙන් පෝෂණයෙන් අනූන තෘණ ආශ්‍රිත තන්තුමය ආහාර මත රඳා පවතී. මෙහිදී ශ්‍රී ලංකාවේ එවැනි ලාභදායි ආහාරයක් සතුටු -දායක ලෙස යොදා නොගන්නා බව පෙනී යයි. **සුළු පරිමාණ කිරි ගොවීන් බහුතරයක් ස්වාභාවික තණකොළ තම සතුන්ට සැපයීම සිදු කරයි.** ස්වාභාවික තෘණ වර්ග ලෙස **ගිනි තෘණ, (Gunea Grass) සිග්නල් තෘණ, (Signal Grass)** රුසි **තෘණ, (Ruze Grass) ජලාශ්‍රිත තෘණ (Water Grass)** සහ **ෆොක්ස් ටෙල්(Fox Tail)** වර්ග සහ ස්වාභාවිකව වැඩෙන වෙනත් වල් තෘණ වර්ග සතුනට ආහාරයට දීම බහුලව සිදු වේ. මෙම තෘණ වර්ගයන් හි ප්‍රමාණවත් පෝෂණ අගයක් නොමැත. එහෙත්, ඉහතින් දැක් වූ තෘණ වර්ග සමහරක් වැඩි දියුණු කළ සහ මෙරටට හඳුන්වා දෙන ලදුව ස්වාභාවිකරණයට ලක් වූ තෘණ වර්ග වන අතර නඩත්තු වෙහි දුර්වලතා නිසා ඒවායේ අස්වැන්න සහ ගුණාත්මය පහත මට්ටමක පවතී. මෙම තෘණ වර්ග වර්ධනය වීම වර්ෂා කාලයේ දී සිදුවීමත් (එම කාල වල අතිරික්තයක් ද පවතී.), වියලි කාලයේ දී වියළී යාමත් නිසා මේරීමට ලක්වීම සඳහා වඩාත් ගුණාත්මයෙන් යුතු හා වර්ධන වේගය වැඩි උසස් වර්ගයේ තෘණ වර්ග වගා කිරීම හා පාලනය පිළිබඳව කිරි ගොවීන් දැනුවත් කිරීම හා උනන්දු කරවීම සිදුකළ යුතු වේ. ඒ ඒ කෘෂි පාරිසරික කාල අනුව සුදුසු තෘණ වර්ග හඳුන්වා දිය යුතුය. විශේෂයෙන්ම, උලාකෑම සඳහා වගා කරනු ලබන **කිකියු (Kikiu)** බහුවාර්ෂික **රයි තෘණ තිමොති (Timothy) සෙටේරියා (Setarea)** වැනි උසස් ගුණාත්මයෙන් යුත් තෘණ වර්ග උඩරට ප්‍රදේශයේ පහසුවෙන් වගා කිරීමේ හැකියාව පවතී. එමෙන්ම, **නේපියර් (Napier) බ්‍රැකේරියා (Bracarea)** තෘණ, **ක්ලෝන්-13 (Clone-13)** වැඩි දියුණු කළ **ගිණි තෘණ (Gunea Grass)** සහ **පැනමා කොරි තෘණ (Corigrass)** වැනි කපා ආහාරයට දිය හැකි **තෘණ (Fodder)** වර්ග ද, මෙම ප්‍රදේශයේ

**සුළු පරිමාණ කිරි ගොවීන් බහුතරයක් ස්වාභාවික තණකොළ තම සතුන්ට සැපයීම සිදු කරයි.**

සහ මැදරට සහ පහතරට තෙත් කලාපයේත්, අතරමැදි කලාපයේ **තෙත් ප්‍රදේශ (Wetter Parts)** වලත් තෘණ වගාවක් ලෙස සංවර්ධනය කළ හැකිය. වියළි කලාපය සඳහා විශේෂයෙන්ම, ගිණි තෘණ හා **සී.ඕ. 3 (Co 3)** තෘණ විශේෂයෙන් ඉතා උචිත තෘණ වර්ග ලෙස හඳුන්වා දිය හැකිය.

උඩරට, මැදරට හා පහතරට තෙත් කලාප සඳහා කපා ආහාරයට ගත හැකි ශාක පෝෂ ලෙස **ග්ලිරිසිඩියා (Gliricidia) කැලියන්ඩ්‍රා (Caliandra) ප්ලෙමින්-ගියා (Flamingia) පෙස්මොඩියම් (Pesmodium)** හා **එරබදු (Dadap)** වැනි රනිල ශාක හා **වල් සූරියකාන්ත** හා මල්බෙරි ආදී රනිල නොවන ශාක වර්ග වැඩි වශයෙන් හෝ තෘණ බිම් වල සෙවන ශාක ලෙස ද වගා කළ හැකිය. එමෙන්ම, **ග්ලිරිසිඩියා** හා **එරබදු** වියළි කලාපය තුළ ද, පහසුවෙන් වගා කළ හැකිය.

අධික බෑවුම් සහිත භූමි ප්‍රදේශයන් හි, තෙත් පරිසර තත්ත්ව යටතේ සහ පොල් හා රබර් වගාවන් හි, වල් මර්ධනය කරනු ලබන **ධාවක (Runners)** ලෙස **ස්ටයිලෝ (Stylo)** සහ **සිරාට්‍රෝ (Siratro)** වැනි රනිල සත්ත්ව පාලනය සඳහා අවශ්‍ය **ජෛව ස්කන්ධ** සැපයීම සඳහා වගා කළ හැකිය.

රනිල ශාක ආහාර කොටස් මඟින් සතුන්ට අවශ්‍ය පෝෂණය මැනවින් ලබාදෙන අතර තෘණ භූමිවල සිටුවීමෙන් නයිට්‍රජන් තිර කිරීමේ කාර්යාවලිය හරහා පාංශු සංවර්ධනයක් ද සිදු කරයි. මෙවැනි පෝෂක තෘණ හා ශාක වර්ග වගා කිරීම සඳහා ගොවීන් යොමු කිරීම හා අවශ්‍ය උපදෙස් හා රෝපණ ද්‍රව්‍ය සැපයීම කෙරෙහි ක්ෂේත්‍රයේ කටයුතු කරනු ලබන නිලධාරීන්ගේ ද අවධානය යොමුවිය යුතුය.

**එමෙන්ම, වියළි කාලයේ දී මුහුණ දීමට සිදුවන ආහාර හිඟය සඳහා විසඳුමක් ලෙස වර්ෂා කාලයේ දී ලැබෙන අතිරික්ත තෘණ අස්වැන්න සකසා තබා ගැනීම වැදගත් වේ.** ඒ සඳහා **හේ** සහ **සයිලේජ්** පිළියෙල කිරීම පිළිබඳව ගොවීන් දැනුවත් කළ යුතු වේ. පිදුරු වැනි රළු ආහාර ලබාදීමේ දී, යූරියා ප්‍රතිකර්මය සිදුකොට පිදුරු යූරියා මිශ්‍රනය ලබාදීම මඟින් සතාගේ ආහාර රුචිය සහ පෝෂණ අගය ඉහළ නැංවීම සිදුකිරීමේ හැකියාව ලැබේ.

> **වියළි කාලයේදී මුහුණ දීමට සිදුවන ආහාර හිඟය සඳහා විසඳුමක් ලෙස වර්ෂා කාලයේ දී ලැබෙන අතිරික්ත තෘණ අස්වැන්න සකසා තබාගැනීම වැදගත් වේ.**

තව ද, කඳුකර ප්‍රදේශ ආශ්‍රිතව පවතින ස්වාභාවික තෘණ භූමි වන පතන, පරිසර හිතකාමී ලෙස ගව පාලනයට යොදා ගැනීම සහ පහත රට වියළි කලාපීය ස්වාභාවික වනාන්තර ආශ්‍රිත විල්ලූ බිම් කෙරෙහි ද අවධානය යොමු කිරීම මඟින් කිරි ගව කර්මාන්තය තුළ තෘණ අවශ්‍යතා-වය සැළකිය යුතු මට්ටමකින් සපුරාගත හැකි වේ. විශේෂයෙන්-ම, වියළි කලාපය තුළ **මහ කන්නයේ දී, වැඩි භූමි ප්‍රමාණයක් වගාව සඳහා යොදා ගැනීමත්, වැව් පිටිය හා වැව් තාවුළු සහ සෙසු ඇළ රක්ෂිත, අනවසර පදිංචි වීම සහ වගාවන් යටතට පත්ව තිබීමත් නිසා සත්ත්ව පාලනයට අවශ්‍ය තෘණ ලබා ගැනීමේ මූලාශ්‍ර බරපතල ලෙස සීමා වී තිබේ.** මෙම තත්ත්වය කිරි ගොවීන් කර්මාන්තයෙන් ඉවත්වීම උත්තේජනය කිරීම සඳහා හේතු පාදක වී ඇති බව පෙනේ.

සත්ත්ව පෝෂණයේ දී ඉතා වැදගත් අංගයක් වන ඛණිජ පෝෂණය, සතුන්ගේ නඩත්තුව, නිෂ්පාදනය සහ ප්‍රජනන හැකියාව සඳහා අවශ්‍ය වන ඛණිජ සංඝටක ප්‍රමාණවත්ව සැපයීම කිරි නිෂ්පාදන ඵලදායි-තාව කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි. ඛණිජ ලබාදීම බොහෝ විට, සාන්ද්‍ර ආහාර සමඟ ඛණිජ කුඩුමය ආකාරයෙන් මිශ්‍ර කර ලබාදීම මඟින් හා **යූරියා මොලෑසස් ඛණිජ** කැටය භාවිතා කිරීම මඟින් සිදු කරනු ලබයි. මෙම ඛණිජ කැටය භාවිතා කිරීම මඟින් සතුන්ගේ ඛණිජ අවශ්‍යතා වය සැපයෙනවා පමණක් නොව **මොලෑසස්** හි අඩංගු වැඩි සීනි ප්‍රමාණය නිසා කෙලින්ම ශක්තිය සැපයීම සහ යූරියා මඟින් රෝමාන්තිකයන්ගේ පූර්ව අමාශයේ ප්‍රෝටීන සංයෝජනය සඳහා ක්ෂුද්‍ර ජීවීන්ට අවශ්‍ය නයිට්‍රජන් සැපයුම සිදුකරයි. එමෙන්ම, එහි අඩංගු **සෝඩියම් කැල්සියම්** හා **පොස්පරස්** මඟින් සතාගේ කිරි නිෂ්පාදනය හා අනෙකුත් ජෛවීය අවශ්‍යතා සඳහා අවශ්‍ය ඛණිජ සැපයීම ද, සිදු කරනු ලබයි. තව ද, සතුන්ට ලබාදෙන ආහාරයන් හි **ජීරණතාව (Digestibility)** වැඩි කිරීම සඳහා ආහාර (විශේෂයෙන්ම තෘණ හා ශාක - **Grass And Fodder**) කුඩා කොටස් වලට කපා ලබාදීම හා තෘණ හා රනිල වර්ග අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් ලබාදීම සඳහා ගොවීන් දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය අංගයක් බවට පත්ව තිබේ.

**කිරි කර්මාන්තය තුළ නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම පිළිබඳව සැළකීමේ දී සත්ත්ව සෞඛ්‍ය සඳහා හිමිවන්නේ විශේෂ ස්ථානයකි.** සෞඛ්‍යාරක්ෂිත මට්ටමේ විධිමත් හෝ අර්ධ විධිමත් තත්ත්වයේ **ගව නිවාසයන් (Cattle Sheds)** පවත්වා ගැනීම යහපත් සත්ත්ව සෞඛ්‍ය රක්ෂණ වැඩපිළිවෙලක් සඳහා වන මූලිකම අංගයක් ලෙස හඳුන්වා දිය හැකිය. නිවැරදි ආකාරයට ගොම හා ගව මූත්‍රා අපවහනය වන පරිදි සකසන ලද ගව නිවාසයක දී සතුන්ට වැළඳිය හැකි **කුර හා මුඛ රෝගය (FMD)** සහ **බුරුෂ ආදාහය (Mastitis)** වැනි

> **කිරි කර්මාන්තය තුළ නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම පිළිබඳව සැළකීමේ දී සත්ත්ව සෞඛ්‍ය සඳහා හිමිවන්නේ විශේෂ ස්ථානයකි.**

රෝගයන්ගේ බලපෑම අවම කරගත හැකිය.

මෙහි දී **ජල බඳුන් (Drinkers)** හා **ආහාර බහාලන කොටස් (Feeders)** නිවැරදි ලෙස සැකසීම මගින් ආහාර අපතේ යාම අවම වීමත්, සතාට අවශ්‍ය ජලය නිරතුරුවම පැවතීමත්, සත්ත්ව පෝෂණය අතින් ඉතා වැදගත් වේ. වර්ෂාව, පිනි සහිත තත්ත්ව සහ දැඩි හිරු රැසින් සිදුවන ආතති තත්ත්වයන් **(Stressed Conditions)** අවම වීම, සත්ත්ව සෞඛ්‍යය හා නිෂ්පාදනය වැඩි දියුණු වීම කෙරෙහි සෘජුවම බලපානු ලබයි. අවසාන වශයෙන්, ගුණාත්මයෙන් යුතු කිරි නිෂ්පාදනයක් සඳහා සුදුසු සෞඛ්‍යාරක්ෂිත වටපිටාවක් නිර්මාණය වීම, ගව නිවාස පවත්වා ගැනීමේ විශේෂ වාසියක් ලෙස සඳහන් කළ හැකිය. ගව නිවාස සෑදීමේ දී, ඒ ඒ පාරිසරික තත්ත්වය යටතේ ඉදිකිරීමට සුදුසු ගව නිවාස සඳහා **සැලසුම් (Plan)** සකස් කරදීම හා අවශ්‍ය උපදේශාත්මක හා මූල්‍යමය දායකත්වය සැපයීම අදාළ ව්‍යාප්ති නිලධාරීන්ගේ ප්‍රධාන වගකීමකි.

දැනට පවතින තත්ත්වය යටතේ රජයේ ව්‍යාපෘති මගින් සපයන හෝ ලබාගන්නා සතුන් සහ බැංකු ණය වැඩසටහන් යටතේ ලබාගන්නා සතුන් රක්ෂණය කිරීම අනිවාර්ය වී තිබේ.

සත්ත්ව රෝග වැළැක් - වීමේ වැඩසටහන් යටතේ ප්‍රධාන වශයෙන්ම ප්‍රධාන ගව වසංගත රෝග වන **කුර හා මුඛ රෝගය (Foot And Mouth Disease)** සහ **ගව රක්තාශ්‍රවය (Haemorrhagic Septocima)** සඳහා එන්නත් වැඩසටහන් ක්‍රියාත්මක වේ. රජයේ පශු වෛද්‍ය කාර්යාල හරහා නොමිලේ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. විශේෂයෙන්ම, වියළි කලාපය තුළ සහ අවදානම් සහිත ප්‍රදේශ තුළ මහ කන්නයේ වර්ෂාව ආරම්භ වීමට පෙර මේවා සිදු කරනු ලබයි. මෙම රෝග වැළැක්වීමේ වැඩසටහන් පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම හා එන්නත් කළ යුතු සතුන් (ගැබ්බර සතුන් හැර), එන්නත් වැඩසටහනට යටත් කිරීම මගින් සත්ත්ව සෞඛ්‍ය ගැටළු අවම කර ගැනීමේ හැකියාව පවතී. සත්ත්ව රෝග නිවාරණ කටයුතු ප්‍රධාන වශයෙන්ම, රජයේ පශු වෛද්‍ය වෘත්තිකයන් හරහා සිදුවන අතර පැහැදිලි පෞද්ගලික අංශයේ මැදිහත්වීමක් මෙම ක්ෂේත්‍රය තුළ දක්නට නොලැබේ. රෝග විනිශ්චය සහ නිවාරණ කටයුතු සඳහා පවතින ක්‍රමවේදය ප්‍රමාණවත් නොවීම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සිදුකරන ලද අධ්‍යයනයන් හා වර්තා රාශියක් මගින් පෙන්වා දී තිබේ. ඒ ඒ පශු වෛද්‍ය කොට්ඨාශ සඳහා විශාල ප්‍රදේශයක් ආවරණය කිරීමට සිදුවීම, පවතින මානව සම්පත් හිඟ බව, අවශ්‍ය ප්‍රතිපාදන අවම වීම, මෙම ඌණ සේවා සැපයීම කෙරෙහි බලපා ඇති බව ද පෙන්වා දෙනු ලැබ තිබේ.

පශු සම්පත් රක්ෂණ වැඩසටහන් යටතේ ගවයින් රක්ෂණය කිරීම, සත්ත්ව පාලනයේ දී සිදුවිය හැකි අවදානම් තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා වැදගත් වන අංගයක් වුව ද, ගව රක්ෂණය කෙරෙහි ගොවීන්ගේ උනන්දුව ඉතාමත් අවම මට්ටමක පවතී. මේ වන විට **කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය** හා එක් පෞද්ගලික රක්ෂණ සමාගම -ක් පමණක් පශු සම්පත් අංශයේ රක්ෂණ කටයුතු වල නියැළී සිටී. **දැනට පවතින තත්ත්වය යටතේ රජයේ ව්‍යාපෘති මගින් සපයන හෝ ලබාගන්නා සතුන් සහ බැංකු ණය වැඩසටහන් යටතේ ලබාගන්නා සතුන් රක්ෂණය කිරීම අනිවාර්ය වී තිබේ.** එම රක්ෂණ වැඩසටහන් කෙරෙහි පවතින විශ්වාසය ගොවීන් කෙරෙන් පහව ගොස් ඇත. පවතින රක්ෂණ වැඩසටහන් පිළිබඳව පවතින ඌණ අවබෝධය සහ රක්ෂණ වන්දි ගෙවීම් කටයුතු වල දී ඇති අකාර්යක්ෂමතාවය මෙම තත්ත්වයට හේතු සාධක වී ඇති බව සඳහන් කළ හැකිය.

**දේශීය කිරි නිෂ්පාදනයෙන් ඉතාමත් වැඩි ප්‍රතිශතයක් අමු කිරි (Raw Milk) ලෙස අලෙවි කිරීම සිදු කරයි.** කිරි අලෙවිය සඳහා ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය හා පෞද්ගලික සමාගම්, ප්‍රාදේශීය මට්ටමින් පිහිටුවා ඇති සමූපකාර සමිති සහ සුළු පරිමාන කිරි ආශ්‍රිත නිෂ්පාදකයන් විසින් සිදු කරනු ලබයි. කිරි එකතු කිරීමේ කාර්යාවලියේ දී **මිල්කෝ (MILCO)** ආයතනය ප්‍රධානතම රාජ්‍ය සමාගම වන අතර පෞද්ගලික අංශය තුළ ප්‍රධාන බහුජාතික සමාගම් දෙකක් හා දේශීය සමාගම් කිහිපයක් මූලිකව කටයුතු කරයි. 1970 සහ 1980 දශක තුළ දී වඩා ශක්තිමත්ව පැවති කිරි නිෂ්පාදන සමූපකාර සමිති වර්තමානයේ දී එක්තරා පසුබෑමකට ලක්ව ඇති බව පෙනී යයි. එමෙන්ම, එම සමූපකාර සමිති කිරි ගොවීන් සහ රාජ්‍ය හා පෞද්ගලික කිරි ආශ්‍රිත නිෂ්පාදන සමාගම් අතර අලෙවියේ දී අතරමැදි කාර්යයක් ඉටු කරන තත්ත්වයට පත්ව සිටී. ගොවීන් ගෙන් කිරි එකතු කොට සමාගම් වෙත අලෙවි කිරීම බොහෝ සමූපකාර සමිති මගින් සිදු කරයි.

කෙසේ වෙතත්, කිරි අලෙවියේ දී ගොවීන් වෙත ලැබෙන මිල කිරි ගව කර්මාන්තයේ සංවර්ධනය සඳහා සෘජුවම බලපෑම් සිදු කරයි. එසේ වුවත් කිරි සඳහා ගොවිපොළ මිල හෝ ගැණුම් මිල තීරණය වන්නේ කිරි සැකසුම්කරුවන් අතින් හෝ කිරි එකතුකරන්නන් අතින් මිස ගොවීන් අතින් නොවේ. කිරි සඳහා වන ගොවිපොළ මිල අඩුවීම කිරි ගව පාලනය වෙතින් ගොවීන් ඉවත්වීම සඳහා අනුබල සැපයීමක් වන

දේශීය කිරි නිෂ්පාදනයෙන් ඉතාමත් වැඩි ප්‍රතිශතයක් අමු කිරි (Raw Milk) ලෙස අලෙවි කිරීම සිදු කරයි.

අතරම කිරි ලීටරයක් සඳහා වන අඩු ලාභ ආන්තිකයක් ගොවියා වෙත ලැබීම සහ ඉතා වැඩි ආන්තිකයක් කිරි ආශ්‍රිත නිෂ්පාදක -යා වෙත ලැබීම ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය පසුගාමී බව තීව්‍ර

13 වෙනි පිටුවට.........

12 වෙනි පිටුවෙන්......

## ශ්‍රී ලංකාවේ කිරි ගව..............

කිරීමට හේතු පාදක වී තිබේ. මෙම අඩු ලාභ ආන්තිකය සඳහා ශ්‍රී ලංකාවේ කිරි ගව කර්මාන්තය තුළ පවතින ඉහළ නිෂ්පාදන පිරිවැය සෘජුවම බලපා ඇත. කිරි නිෂ්පාදනයේ ඵලදායිතාවය වැඩි කිරීම සඳහා ඒ ඒ ක්ෂේත්‍ර ඔස්සේ අවශ්‍ය පියවර ගැනීම තුළින් පිරිවැය අඩු කර ගැනීමක් සිදු කළ හැකි වේ. එමෙන්ම, කිරි අලෙවිකරණයේ දී ඉහත සඳහන් කළ ආයතන හා ගොවීන් අතර සිටින අතර-මැදියන්ගෙන් ගොවීන් ආරක්ෂා කර ගැනීම සඳහා සුදුසු අලෙවිකරණ ජාලයක් ඒ ඒ ආයතන විසින් ස්ථාපනය කිරීම වැදගත් ය.